නිපුණතාව 01-ආර්ථික පද්ධතියක මූලික ආර්ථික ප්‍රශ්න හා ඒවා විසඳා ගන්නා විකල්ප ක්‍රම තුලනාත්මකව විග්‍රහ කරයි.

නිපුණතා මට්ටම - ආර්ථික විද්‍යා විෂය ක්ෂේත්‍රය පරීක්ෂා කරයි.

- සමාජයේ ජීවත්වන මිනිසුන්ට විවිධ අවශ්‍යතා පවතී.මෙම අවශ්‍යතා,
  1.භෞතික අවශ්‍යතා
  2.මානසික අවශ්‍යතා ලෙස වර්ග කරයි.

- භාණ්ඩ හා සේවා පාරිභෝජනය මගින් සෘජුවම සපුරා ගත හැකි අවශ්‍යතා භෞතික අවශ්‍යතා ලෙස හැඳින්වේ.උදා-ආහාර,නිවාස,ඇඳුම්
- භාණ්ඩ හා සේවා පාරිභෝජනයෙන් සෘජුවම සපුරා ගත නොහැකි මානසික අවශ්‍යතාද පවතී.උදා-ආධ්‍යාත්මික සංවර්ධනය,ආදරය,කරුණාව

## <u>ආර්ථික හැසිරීම්</u>

- මිනිසුන් සමාජයේ පවතින සීමිත සම්පත් යොදා ගෙන භෞතික අවශ්‍යතා හා වුවමනා ඉටු කර ගැනීමට සිදු කරන ක්‍රියාකාරකම් හා හැසිරීම් ආර්ථික හැසිරීම් ලෙස හඳුන්වයි.නිදසුන්-භාණ්ඩ හා සේවා නිෂ්පාදනය,බෙදා හැරීම හා පාරිභෝජනය

- සමාජයේ මිනිසුන්ගේ විවිධ හැසිරීම් පවතින අතර,මිනිසුන්ගේ ආර්ථික හැසිරීම් පිළිබඳ අධ්‍යයනය ආර්ථික විද්‍යාව තුළින් සිදු කෙරේ.

## <u>අභ්‍යාස</u>

1.ආර්ථික විද්‍යාව විද්‍යාවක් සේ සැලකෙන්නේ ඇයි?
2.ආර්ථික විද්‍යාව අනෙකුත් ස්වාභාවික විද්‍යාවන්ගෙන් වෙනස්වන ප්‍රධාන සාධක කිහිපයක් නම් කරන්න.
3.ආර්ථික විද්‍යාවේදී අධ්‍යයනයට ලක් වන “ආර්ථික පැතිකඩ ” යන්නෙන් අදහස් වන්නේ කුමක්ද?